**මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 05 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජුනි 30 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ විවිධ තැන්පත් ගිණුමේ ශේෂය රු. 240,820 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල රු.452,917 ක් වූ උසාවි දඩ ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු. 670,165 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු. 217,248 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් ශේෂය රු. 2,972,480 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු. 2,637,482 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු. 334,998 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ එකතුව රු. 17,160,443 ක්වූ ආදායම් ණයගැති ශේෂය, අදාල ආදායම් ශීර්ෂ බැර නොකර සමුච්චිත අරමුදලට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2016 වර්ෂයේ විවිධ ණයහිමියන් රු. 1,060,593 ක ශේෂය, අදාල වියදම් ශීර්ෂවලට හර නොකර සමුච්චිත අරමුදලට හර කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් පුස්තකාල පොත්වල වටිනාකම වූ රු .243,500 ක මුදල ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට බැර නොකර, සමුච්චිත අරමුදල් ගිණුමට බැර කිරීම හේතුවෙන් සමුච්චිවත අරමුදල් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී රු. 57,583 ක් වැයකර මිලදී ගත් ප්‍රාග්ධන වත්කම් වර්ග 04 ක් අයභාර වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි .

(ඌ) සභාව භාවිතා කරන පිළිසරු සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය හා එම ඉඩම, පුස්තකාල 03 ක් පිහිටි ඉඩම්, පොදු ක්‍රීඩා පිටි 13 ක් පිහිටි ඉඩම්, සුසාන භූමි 32 ක් පිහිටි ඉඩම් සහ ආයුර්වේදය හා එය පිහිටි ඉඩම පවරාගෙන ඒවායේ වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) ප්‍රාදේශීය සභා අන්තර් ගම්මාන සංවර්ධන වැඩසටහනට අදාලව කොන්ත්‍රාත්කරුවන් සමඟ ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව සභාව විසින් නිරවුල් කළයුතු රු. 2,560,241 ක මුදලක්, ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

------------------------------

පහත සඳහන් නොසැසදීම් අනාවරණය විය.

(අ) ප්‍රාදේශීය සභාවේ ස්ථාවර වත්කම් වටිනාකම, ප්‍රාග්ධන යෙදුමට අදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂයට සමාන වියයුතු වුවත්, එම ශේෂයන් අතර රු. 243,500 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා විගණනයට ඉදිරිපත් කල ශේෂ පත්‍රයේ පැවති කාරක ප්‍රාග්ධනයේ වටිනාකම ඌන කාරක ප්‍රාග්ධනයක් ලෙස දක්වා තිබුණද එහි දක්වා තිබෙන ජංගම වත්කම් හා ජංගම වගකීම් ශේෂයන් අනුව කාරක ප්‍රාග්ධනයේ වටිනාකම රු.27,051,669 ක් වන අතර එය 26,664,262 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 387,407 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණ මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අගයන් හා ඊට අදාළව ඉදිරිපත් කර ඇති උපලේඛනයේ අගයන් අතර රු. 19,956,573 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබිය යුතු ගිණුම් ශේෂ තුල ඇතුලත් වසර 2-20 අතර කාලයක සිට පවතින ශේෂ වල වටිනාකම රු. 187,846 ක් වු අතර ඒවා සමාලෝචිත වර්ෂය තුලදීද ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ආ) විවිධ ව්‍යාපෘති සඳහා අත රඳවාගෙන තිබුණු කර්මාන්ත තැන්පත් මුදල් රු. 3,709,928 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

----------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු. 218,690,007 ක් වූ වත්කම් විෂයයන් 07 ක් හා රු. 1,066,891 ක් වූ වගකීම් විෂයයක් අයිතිය තහවුරු කිරීමේ ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.5 නීති රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

------------------------------------------------

පහත දැක්වෙන නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ------------------------------ | ----------------- |
| (අ) 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන රීති)<br>------------------------------ | |
| (i) රීති අංක 19 | 2016 වර්ෂයේ නිකුත් කර තිබුණු ලදුපොත් 05 කට අදාල උපපත්‍රිකා 2017 මැයි මාසය අවසන් වන විටත් ආපසු භාරගෙන නොතිබුණි. |

(ii) රීති අංක 59 සිට 63 දක්වා

සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් සෑම වර්ෂයකම මාර්තු 31 දින වන විට පිළියෙල කර ඒ අනුව ලේබන සංශෝධනය කර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි

(iii) රීති අංක 203, 204 හා 218

සභාවේ දේපල සම්බන්ධ පූර්ණ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

--------------------------------

(i) මු.රෙ. 104

අන්තර්ගම්මාන ව්‍යාපෘතිය යටතේ රු. 3,939,000 ක් වැයකර ඉදිකරන ලද පාලමක් කඩා වැටීම සම්බන්ධ අලාභ හානි සම්බන්ධයෙන් වාර්තා සකස් කර අදාළ පාඩු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ii) මු.රෙ. 156(1)

වගකිවයුතු නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් නියමිත දිනට විදුලි බිල්පත් හා සේවා නියුක්ති භාර අරමුදල් නොගෙවීම හේතුවෙන් රු. 18,575 ක් පොලී හා අධිභාර සභාවට ගෙවීමට සිදුවී තිබුණු නමුත් ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) මු.රෙ. 571, 572

සෑම අර්ධ වර්ෂයකම අවසානයේදී ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබඳව ලැයිස්තු පිළියෙල කර විමසීම් කර සහා ආදායමට බැර කිරිමට කටයුතු කළ යුතු වුවත්, තැන්පත් කර වසර 2 සිට 5 දක්වා කාලයක් ගත වී තිබුණු

| | | |
|---|---|---|
| | | රු. 3,377,566 ක් වටිනාකමැති තැන්පත් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. |
| (iv) | මු.රෙ. 1646 | වාහනවල දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ සෑම මසක් අවසන් වීමෙන් පසු ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. |
| (v) | මු.රෙ. 1647 | වාහන පිළිබඳ සමීක්ෂණයක් සෑම වර්ෂයක් අවසානයේදීම පවත්වා, එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එලෙස කටයුතු කර නොතිබුණි. |

(ඇ) චක්‍රලේඛ හා චක්‍රලේඛ ලිපි

-----------------------------

| | |
|---|---|
| 1995 ජනවාරි 29 දිනැති අංක NCP/PL/4/2/10/1/92 දරන උතුරුමැද පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | පළාත් පාලන ආයතනවල සේවය කරන නිලධාරීන් පරිහරණය කරනු ලබන හා භාරයේ ඇති වත්කම්වල ස්වභාවය අනුව සේවක ඇප මුදල් අය කළ යුතු වුවත්, 2014 වර්ෂයෙන් පසු සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,152,038 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,942,753 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 වරිපනම් හා බදු

-------------------

2016 ජනවාරි 01 දිනට ශේෂය රු. 2,594,969 ක් හා වර්ෂය සඳහා බිල්කළ මුදල වූ රු. 1,371,598 ක් සමඟ වර්ෂය තුලදී එකතු කළ යුතු වරිපනම් ආදායම රු. 3,966,567 ක් වුවද එයින් රැස්කළ ආදායම රු. 1,186,894 ක් වුයෙන් එය එකතු කළ යුතු ආදායමින් සියයට 30 ක් විය. එහෙත් හිඟහිටි වරිපනම් සම්බන්ධව ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්

-------------------

2016 ජනවාරි 01 ශේෂය රු. 665,544ක් වු විකුණුම් ( ජලය, විදුලිය) ආදායමෙන් සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ ආදායම රු. 10,950 ක් හෙවත් සියයට 2 ක් විය.

2.2.3 උසාවි දඩ ආදායම්

---------------------

2016 ජනවාරි 01 දිනය ශේෂය රු. 10,253,033 සහ සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල වූ රු. 6,000,000 ක් ද සමඟ මුළු ඇස්තමේන්තුගත උසාවි දඩ ආදායම රු. 16,253,033 ක් වූ අතර වර්ෂය තුළ සත්‍ය වශයෙන් රැස්කළ ආදායම රු. 500,000 ක් වුයෙන් එය එකතු කල යුතු ආදායමින් සියයට 3 ක් වී තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

----------------

ආරම්භක ශේෂය රු. 5,705,050 ක්ද වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල රු. 1,000,000 ක්ද ඇතුළුව මුළු ඇස්තමේන්තුගත මුද්දර ගාස්තු ආදායම රු. 6,705,050 ක් වුවද වර්ෂය තුළ කිසිදු මුදලක් රැස්කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------**

3.1 කාර්ය සාධනය

----------------

(අ) 2016 පළාත්සභා සංවර්ධන ප්‍රදාන යටතේ ව්‍යාපෘති 03 ක් සඳහා රු. 2,235,572 ක මුදලක් ඇල මාර්ග ප්‍රතිසංස්කරණය හා අමුණක් ඉදිකිරිම වැනි ප්‍රාදේශිය සභාවේ විෂයය පථයට අයත් නොවන කටයුතු සඳහා වැයකර තිබුණි.

(ආ) ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරිමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 19 ක් සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන මුදල් රු. 4,475,000 කින් රු. 800,000 ක් වටිනා ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

(අ) සභාවේ කටයුතු සඳහා යොදාගෙන තිබෙන වාහන 04 ක ලියාපදිංචි සහතික සභාව නමින් සකස් කර ගැනීම සඳහා මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) ධාවන තත්ත්වයේ නොපවතින රථ වාහන 03 ක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) සභාව සතු වාහන වලට අදාළ මාසික ධාවන සටහන් වගකිවයුතු නිලධාරීන් වෙත ලබා ගැනීම විධිමත්ව සිදුකර නොතිබුණු අතර විගණනය වෙත ඉදිරිපත් කිරිමටද කටයුතු කර නොතිබුණි. ධාවන සටහන් ඉදිරිපත් නොකර සමාලෝචිත වර්ෂයේදී මීටර් පැය1045 ක් හා කිලෝමීටර් 80240 ක් ධාවනය කර තිබුණි.

(ඈ) වාහන කුලියට දීමේ හිඟ ආදායම් හඳුනාගැනීමට හැකි පරිදි ලේඛණ පවත්වා නොතිබිම හේතුවෙන් 2014 වර්ෂයට අදාළ රු. 342,180 ක හිඟ ආදායම් අයකර ගත්තේද යන්න හා වර්ෂයට අදාළ හිඟ ආදායම් කොපමණද යන්න හඳුනා ගැනීමට නොහැකි විය.

(ඉ) ප්‍රාදේශිය සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය තනතුරක් වූ කාර්මික නිලධාරී තනතුර 2007 වර්ෂයේ සිට පුරප්පාඩු වී පැවතුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

(අ) සභාව සතු ඉදිකිරීම හා මාර්ග සංවර්ධන කටයුතු වලට යොදාගත හැකි ටිපර් රථ 03 ක් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් ඩබල් ඩ්‍රම් ගල් රෝලක්, ට්‍රැක්ටර් 08 ක්, කොන්ක්‍රිට් බ්ලොක් ගල් යන්ත්‍රයක්, කොන්ක්‍රිට් මිශ්‍රණ යන්ත්‍රයක් හා JCB යන්ත්‍රයක් පවතින නමුත් මෙම යන්ත්‍ර සූත්‍ර ක්‍රියාකාරී සැලැස්මක් තුළින් ඵලදායි ලෙස මෙහෙයුම් කටයුතු වල යොදවා ඒවා පිළිබඳ පැහැදිළි විස්තර සහිත වාර්තා පවත්වා නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ වාහන හා යන්ත්‍ර සූත්‍ර යෙදවීම තුළින් රියදුරු වැටුප් වලට අමතරව පැනනැඟුනු රු. 224,885 ක මෙහෙයුම් අලාභය පොදු මහජන සේවය සඳහා යෙදවීම නිසා පැන නැඟුන බව තහවුරු නොවුණි.

(ආ) උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2015 පසුගාමී හා හුදකලා ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ යුධගනාව තුලාන බෑග් වර්ග නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් සඳහා රු. 300,000 වටිනා උපකරණ, 2016 වර්ෂයේදී ප්‍රාදේශීය සභාව හරහා ලබාදී තිබුණු නමුත් ඒ සඳහා ශක්‍යතා අධ්‍යනයක් කිරීම හා ප්‍රතිලාභීයා සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීම සිදුකර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපෘතිය මෙතෙක් ක්‍රියාත්මක වී නොතිබුණි.

3.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

-----------------------------------------

සභාව සතු රු. 2,765,362 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ ඒකක 07 ක් වසර 3 සිට 9 දක්වා කාල පරාසයක් තුල නිෂ්කාර්යව හා ස්වභාවික ආපදාවනට ලක් වෙමින් පවතින නමුත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ප්‍රාදේශීය සභාවේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් තවදුරටත් විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ණයගැති/ණයහිමි පාලනය

(ඉ) අභ්‍යන්තර පාලනය

(ඊ) වාහන පාලනය